// Sri Lanka national emblem

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1967/53 - 2016 මැයි මස 19 වැනි බ්‍රහස්පතින්දා - 2016.05.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 100% ක ආනයන බදු වලින් නිදහස් පදනම යටතේ ආනයනය කරන ලද වාහන අපහරණය සඳහා 2003 අංක 2 දරන රේගු (සංශෝධිත) පනතේ ''ඉ'' උපලේඛනය යටතේ රේගු වටිනාකම නියම කිරීමේ ක්‍රමය

2003 අංක 2 දරන රේගු (සංශෝධිත) පනතේ ''ඉ'' උපලේඛනය යටතේ ඇති විධිවිධානයන්ට අනුව 2015 නොවැම්බර් මස 19 දින හෝ ඊට පෙර 100% ක ආනයන බදු වලින් නිදහස් පදනම යටතේ ආනයනය කරනු ලැබූ හා ලියාපදිංචි කරනු ලැබූ මෝටර් රථ අපහරණය සඳහා රේගු වටිනාකම නියම කිරීමේ ක්‍රමය මෙයින් දක්වෙන අතර අදාළ වරප්‍රසාද හිමිකරුවන් වන්නේ රාජ්‍යතාන්ත්‍රිකයන් හෝ රාජ්‍ය තාන්ත්‍රික සංවිධාන වලට පමණක් බව මෙයින් නියම කරනු ලැබේ.

ඒ අනුව ආනයනය කරන ලද කාලය හා අපහරණය කරනු ලබන කාලය අතර වාහනය භාවිතා කරනු ලැබූ කාල සීමාව පදනම් කරගෙන ක්ෂය වූ වටිනාකමත්, ආනයනය කරනු ලබන කාලයේ දී එකී වාහනයේ මි. ර. ගැ. වටිනාකමත් පහත වගුවේ දක්වේ.

වාහනය අපහරණය කරනු ලබන අවස්ථාවේ දී ගෙවිය යුතු බද්ද එකී වාහනය ආනයනය කරන ලද අවස්ථාවේ දී පැවති බදු පදනම අනුව ගණනය කළ යුතු ය.

**100%ක ආනයන බදු වලින් නිදහස් පදනම යටතේ ආනයනය කරන ලද හා ලියාපදිංචි කරන ලද මෝටර් රථ අපහරණය සඳහා ක්ෂය වූ වටිනාකම**

| *වාහනය නිෂ්පාදිත දිනයේ සිට වරප්‍රසාද හිමි අය විසින් භාවිතා කරනු ලැබූ කාලය* | *මි. ර. ගැ. වටිනාකම මත* ***(CIF Value)*** |
|---|---|
| වසර 01 කට අඩු | 100% |
| වසර 01කට වැඩි හා වසර 02කට අඩු හෝ සමාන | 90% |
| වසර 02කට වැඩි හා වසර 03කට අඩු හෝ සමාන | 85% |
| වසර 03කට වැඩි හා වසර 04කට අඩු හෝ සමාන | 80% |
| වසර 04කට වැඩි හා වසර 05කට අඩු හෝ සමාන | 75% |
| වසර 05කට වැඩි හා වසර 06කට අඩු හෝ සමාන | 70% |
| වසර 06කට වැඩි හා වසර 07කට අඩු හෝ සමාන | 65% |
| වසර 07කට වැඩි හා වසර 08කට අඩු හෝ සමාන | 60% |
| වසර 08කට වැඩි හා වසර 09කට අඩු හෝ සමාන | 55% |
| වසර 09කට වැඩි හා වසර 10කට අඩු හෝ සමාන | 50% |
| වසර 10කට වැඩි | 40% |

රවි කරුණානායක,
මුදල් අමාත්‍ය.

2016 මැයි මස 19 වැනි දින,
මුදල් අමාත්‍යාංශය,
කොළඹ.

06-244